**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2018**

**------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියාකර ඇති බව,

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට සේවක විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා රු.මිලියන 11.01 ක් වෙන් කල යුතු වුවද එදිනට රු.මිලියන 8.39 ක මුදලක් පමණක් වෙන්කර තිබුණි. | ජර්නල් සටහන් යෙදීමේදී අදාල වැරැද්ද සිදුවී ඇති අතර 2019 වර්ෂය සඳහා අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති බැරකම් ගිණුම් ගත කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිතාවය තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් රඳවා ගෙන තිබුණු රු.මිලියන 8.09 ක මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදලින් අඩුකර දැක්වීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ වටිනාකම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂය සඳහා අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 දෙසැම්බර් 31 දිනට සහතික කරන ලද වැඩ වටිනාකම කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර තිබුණු රු. මිලියන 1.01 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් ලැබීම් යටතේ දක්වා තිබුණි. | සංවිධානය විසින් බැංකු තැන්පත් පතෙහි සඳහන් කරනු ලබන අයදුම්පත් අංකය මුදල් බැංකු ගත කරන අවස්ථාවේ ඇතුලත් කිරීමට බැංකුවට උපදෙස් දී ඇතත් එසේ කිරීමට අතපසු වූ අවස්ථාවල තැන්පත්කරුවන් හඳුනා ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම තත්වය උදාවී ඇත. | පර්යේෂණ සංවිධානයේ බැංකු ගිණුම්වල සෘජුව සිදු කරණු ලබන තැන්පත් හදුනාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස්කල යුතුය. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ගෙන් වැඩිපුර ලැබීම් ලෙස දක්වා තිබුණු රු. මිලියන 1.43 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණු එකතුව රු. මිලියන1.23 ක ශේෂ ද ඊට ඇතුලත් විය. | 2019 වර්ෂයේදී මෙම මුදල් ආදායමට ඇතුලත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ නිරවුල් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 1.5.3 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම
---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩුගන්නාව දෙමළ මහා විද්‍යාල පරිශ්‍රය නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 25.23 ක් නමුත් රු.මිලියන 29.50 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඉංජිනේරු ඇස්තමේන්තුවේ වූ අඩුපාඩු හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 17 ක ඉහල වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | කඩුගන්නාව දෙමළ මහා විද්‍යාල වැඩ බිමෙහි පැවති ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් සියළු දෙනාම ප්‍රතිස්ථාපන වියදම්, ව්‍යාපෘති පරිශ්‍ර වියදම් සහ කොන්ක්‍රීට් වැඩ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව ඉහල අගයක මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. අදාල ප්‍රායෝගික තත්වයන් සලකා බලා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු ඇගයීම් සිදුකර අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර ඇත. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම මගින් මෙම අඩුපාඩු නිවැරදි කර ගත හැකි වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිගමුව කොච්චිකඩේ තෝප්පුව පාලම අසල ගං ඉවුර බාදනය වීම වැලැක්වීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු සැලසුම් සකස් කිරීම වෙනුවෙන් පර්යේෂණ සංවිධානයේ භූ තාක්ෂණික හා ඉංජිනේරු අංශය විසින් භාරගෙන තිබුණු උපදේශක කාර්යයන් වෙනුවෙන් රු. මිලියන 10.96 ක මුදලක් අයකර තිබුණ නමුත් ඒ සඳහා දරා තිබුණු සත්‍ය වියදම රු.මිලියන 6.85 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුවේ වියදම් වැඩියෙන් දැක්වීම මගින් භාණ්ඩාගාර ප්‍රතිපාදන මත භූ තාක්ෂණික හා ඉංජිනේරු අංශය විසින් රු.මිලියන 4 .12 ක ලාභ තීරුවක් රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය වූ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන් මේ දක්වා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වෙනත් බාහිර ව්‍යාපෘතීන් සහ උපදේශන සේවා සැපයීමේදී යොදා ගත් ඒවා වේ. විගණනයේදී පෙන්වා දුන් පරිදි උපදේශන සේවා සඳහා වන ගාස්තුව ගණනය කර අදාල ගැලපීම් 2019 වර්ෂයේදී සිදුකරනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපෘති සඳහා උපදේශක සේවා සැපයීමේ සාධාරණ ලාභ තීරුවක් පවත්වා ගැනීම පිළිබඳව සලකා බැලිය යුතු වේ. |
| (ඇ) | 2018 වර්ෂයේ ස්වයංක්‍රිය වර්ෂාමාන 30 ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.මිලියන 31 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසාගෙන තිබුණ නමුත් ඒ සඳහා පර්යේෂන සංවිධානය විසින් පිළියෙල කර තිබුණු ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 17.3 ක් පමණක් විය.කෙසේ වෙතත් වර්ෂාමාන ස්ථාපිත කිරීම සඳහා ප්‍රදානය කර තිබුණ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 12.85 ක් විය. නිසි අධ්‍යයනයකින් තොරව ප්‍රතිපාදන වෙන්කර ගැනීම සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් රු.මිලියන 18.15 ක වැඩිපුර ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විටත් අදාල වර්ෂාමාන ස්ථාපිත කළයුතු ස්ථාන හඳුනාගෙන නොතිබුණි. | 2016 වසරට පෙර ස්වයංක්‍රීය වර්ෂාමාන නිෂ්පාදනය කර සවිකිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් වූයේ එක් ආයතනයක් මගින් වුවත් ඉන් පසුව මේ සම්බන්ධව තාක්ෂණික ක්‍රියාවලිය ව්‍යාප්ත වීමත් සමග මෙම උපකරණ නිෂ්පාදකයින් සංඛ්‍යාව වැඩි වූ අතර ඒ සඳහා තරඟකාරී ලංසු ඉදිරිපත් විය. එම තත්වය මත මෙම උපකරණ වල මිල ප්‍රමාණාත්මක වෙනසකට ලක්ව මිල පහළ බැසීමට හේතු විය. මෙම ව්‍යාපෘතිය සඳහා ලද ඉතිරි ප්‍රතිපාදන යොදවා අමතර වර්ෂාමාන 15 ක් ස්ථාපනය කිරීම සඳහා කටයුතු කර ඇති අතර මේ වනවිට සියළුම වාර්ෂාමාන සවිකර අවසන් කර ඇත. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පවත්නා පරිසරාත්මක සාධක සාධාරණව ඇගයීම මගින් අරමුදල් උපයෝජනය කාර්යක්ෂමව සිදුකල හැකිවේ. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂය | මුදල<br>රු.මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වෙන්කර තිබුණු ප්‍රතිපාදන වෙනත් පරිබාහිර කාර්යයන් සඳහා උපයෝජනය කිරීම. | 16.81 | භාණ්ඩාගාර අනුමැතිය | අදාල මුදල් හුවමාරුව සඳහා මහා භාණ්ඩාගාරය වෙත අනුමැතිය සඳහා යවා ඇති අතර, ඒ පිළිබඳව භාණ්ඩාගාරයෙන් විමසා ඇත. | ප්‍රතිපාදන උපයෝජනය කිරීමට පෙර අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්සල නවෝදයා විද්‍යාලයේ සහ බදුල්ල වැවේගම රෝහල් පරිශ්‍රයේ සිදු කළ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවන් 2016 අප්‍රේල් වන විට කොන්ත්‍රාත්තු අත්හැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගෙන තිබුණු අත්තිකාරම් මුදලින් පියවාගෙන නොතිබුණු රු.මිලියන 1.66 ක් ආපසු ලබා ගැනීමට හා එම ව්‍යාපෘතිවල කාර්යසාධන ඇපකර වටිනාකම වූ රු.මිලියන 1.57 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති දෙක කොන්ත්‍රාත්කරු විසින් නතර කරන අවස්ථාව වන විට අත්තිකාරම් මුදලට සරිලන වැඩ ප්‍රමාණයක් අවසන් කර තිබුණි.තවද මේ සඳහා කාර්ය සාධන ඇපකර අයකර ගැනීමට අදාල රක්ෂණ සමාගම වෙත කිහිපවරක් ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කළ නමුත් සමාගම මුදල් නිදහස් කිරීමට කටයුතු කර නොමැත.මෙම සිදුවීමෙන් අනතුරුව රක්ෂණ සමාගම් වලින් ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන බැදුම්කර ලබාගැනීම නතර කර ඇත. | කොන්ත්‍රාත් අධීක්ෂණ කටයුතු විධිමත්ව හා නිරන්තරයෙන් සිදු කිරීමටත් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කාර්ය සාධන ඇපකර වානිජ බැංකු මගින් පමණක් ලබා ගැනීමටත් කටයුතු කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 5.92 ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණු නමුත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි. | මෙම මුදල අයකර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයට නාගරික සංවර්ධන අධිකාරියට හා මහා භාණ්ඩාගාරයට අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලා ඉදිරිපත් කරන ලද අතර මේ සඳහා සාකච්ඡා කීපයක්ද පවත්වන ලදී. මේ වෙනුවෙන් තවදුරටත් කටයුතු කරමින් සිටින අතර මෙතෙක් සාර්ථක කර ගැනීමට අවකාශ ලැබී නොමැත. | රාජ්‍ය ආයතනයක් බැවින් මේ සම්බන්ධයෙන් එකඟතාවයක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 අත්තිකාරම්

----------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 - 2017දක්වා කාලය තුළ පර්යේෂණ සංවිධානය විසින් ප්‍රදානය කර තිබුණු නායයාම් අවදානම අවම කිරීම සම්බන්ධ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු 22 ක වැඩ සම්පූර්ණ කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු. මිලියන 75.43 ක මුදල ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් පියවාගෙන නොතිබුණි. | 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ප්‍රදානය කර ඇති සියළු කොන්ත්‍රාත් මේ වන විට අවසන්ව ඇති බැවින් 2019 වර්ෂයේදී සියළු අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | අතුරු ගෙවීම් වලින් අදාල අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම අවදානම පැන නැගී ඇත.ඒ අනුව අදාල අත්තිකාරම් අය නොකිරීම සම්බන්ධ වගකිව යුතු සියළුම පාර්ශවයන් හඳුනාගෙන ඒ සම්බන්ධ සිදුවිය හැකි අලාභයන් අවම කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 835 (2) ඇ | පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාල 10 ක් පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ලබාගෙන තිබුණු ගොඩනැගිලි වෙනුවෙන් රු.මිලියන 9.39 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණ අතර ඒ සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී කුලියට ලබා ගන්නා ගොඩනැගිලි සඳහා මුදල් රෙගුලාසි 835 (2) ඇ ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීමට හා ඒ අනුව ගොඩනැගිලි කුලිය සංශෝධනය කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 63.68 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 43.83 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. මිලියන 19.85 ක වර්ධනයක් පැවති බව නිරීක්ෂණය විය. මේ සඳහා ස්ථාවර තැන්පත් මත උපයාගත් පොළී ආදායම වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

---------------------------------------------------------------------------

**2.2.1** පර්යේෂණ සංවිධානයේ එක් එක් අංශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් ප්‍රතිඵල ඉකුත් වර්ෂයට සාපේක්ෂව ගලපා පහත සටහනේ දැක්වේ.

| අංශය | දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් අතිරික්තය | | මෙහෙයුම් ප්‍රතිඵලයේ වැඩිවීම/ ( අඩුවීම) රු. | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **2018 මෙහෙයුම් අතිරික්තය රු.** | **2017 මෙහෙයුම් අතිරික්තය රු.** | | |
| පරිසර අධ්‍යයන සහ සේවා | 15,047,412 | 12,947,606 | 2,099,806 | 16 |
| භූතාක්ෂණික හා ඉංජිනේරු | 8,894,222 | 1,149,561 | 7,744,661 | 674 |
| ව්‍යාපෘති කළමනාකරණ | 2,331,376 | 3,322,257 | (990,881) | (30) |
| නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ | 348,249 | 11,746,814 | (11,398,565) | (97) |
| මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ | 11,198,228 | 2,879,675 | 8,318,553 | 289 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂණ | 6,140,146 | 9,697,689 | (3,557,543) | (37) |

උක්ත තොරතුරු අනුව ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂණ අංශය හැර මෙහෙයුම් ප්‍රතිඵලයේ අතිරික්තය වාර්තා කරන ලද අනෙකුත් අංශ, ස්වයං මූල්‍යයනය පදනම මත කටයුතු කරන අංශ වන අතර මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරණු ලබන අංශ ආදායමට වැඩි වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ සංවිධානයට නීතිමය තත්වය ලබාදීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2010 ජූනි 02 දින අනුමැතිය ලැබී තිබුණ අතර ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. කෙසේ වෙතත් අදාල පනත 2018 දෙසැම්බර් 31 දින වනතුරුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් යෝජිත පනත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය සංශෝධන කර අවසන් වාර්තාව එවා ඇත.යෝජිත පනතේ අවසන් වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට හා මුදල් අමාත්‍යාංශය වෙත ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා යොමු කර ඇත. | පර්යේෂණ සංවිධානය ව්‍යවස්ථානුකූල ආයතනයක් බවට පත්වීම මගින් ශ්‍රී ලංකාව මුහුණපා තිබෙන ප්‍රධාන ස්වභාවික ආපදාව වන නාය යෑම් අවදානම අවම කර ගැනීම සඳහා පර්යේෂණ සංවිධානයේ දායකත්වය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.එහෙයින් කඩිනමින් පනත් කෙටුම්පත් සම්මත කිරීමට කටයුතු කළ යුතුව පවතී. |
| (ආ) | රත්නපුර, කෑගල්ල සහ මහනුවර පිහිටි පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාල පවත්වාගෙන යන ගොඩනැගිලිවල එම කාර්යාල සඳහා අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා අමතර ඉඩකඩ පවතින නමුත් ඒ බව නොසලකා එම දිස්ත්‍රික්කවල ව්‍යාපෘති කාර්යාල පවත්වාගෙන යාමට වෙනත් ගොඩනැගිලි කුලියට ලබාගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 1.16 ක මුදලක් වැයකර තිබුණි. | දිස්ත්‍රික් කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමේදී පරිපාලනමය අවශ්‍යතාවන්ට මුල්තැන දී කටයුතු කළ අතර ව්‍යාපෘති කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමේදී වැඩ බිම්වලට ආසන්නවීම සහ නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැපයීමේ හැකියාව කෙරෙහි අවධානය යොමුකරන ලදී. සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති කාර්යාල දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කර ඇත. | අතිරේක වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ටෙන්ලිබර්ග් වත්ත නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු මාර්ග අපහසුතා හේතුවෙන් අවලංගු කර කඩුගන්නාව දෙමළ මහා විද්‍යාලයේ නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය තෝරාගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘති තෝරා ගැනීම ප්‍රමුඛතාවයක් මත සිදු නොවන බවත් මාර්ග පහසුකම් පවතින ස්ථානවල පමණක් නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | මාර්ග අපහසුතා තිබියදී ලංසුකැඳවීමක් සිදු කලද සාර්ථක ලංසුකරුවන් ඉදිරිපත් නොවන හා ඉදිරිපත් කරන ලංසු ඉතා ඉහල අගයක් ගන්නා බව අපගේ අත්දැකීමයි.තවද එවැනි අවස්ථාවලදී අවම මිල ගණන් ඉදිරිපත් කරන ලංසුකරුවන් අදාල ව්‍යාපෘතිය අතර මඟදී අතහැර දමන අවස්ථා ඇත.කඩුගන්නාව දෙමළ මහා විද්‍යාලයේ ගොඩනැගිලි වල පැවති අනතුරුදායක තත්වය මත එහි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අවදානම සලකා බලා ඒ සම්බන්ධයෙන් ලැබුණු ඉල්ලීම් පිළිබඳ අවධානය යොමුකර කඩුගන්නාව දෙමළ මහා විද්‍යාලය නායයෑම් අවදානම් අවම කිරීම සඳහා තෝරා ගන්නා ලදි. | ප්‍රමුඛතාවයට අනුව නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් ආපදා අවදානම අවම කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවූ මහනුවර දිස්ත්‍රික්කයේ කැන්දව, ධර්මරාජ පිරිවෙන හා ඩීන්සයිට් නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති 03 වෙනුවෙන් රු. මිලියන 8.35 ක මුදලක් වැය කර තිබුණි. | මෙම කොටස් මූලික සැලසුම් වල අන්තර්ගතව තිබූ අතර, එම අවස්ථාවේ තාක්ෂණික දැනුම හා පලපුරුද්ද ඇති පාර්ශව නොසිටි බැවින් මෙම කොටස් පසුව සිදුකිරීමට තීරණය කරන ලදී. ඒ අනුව අදාල කාර්යයන් මෙම වර්ෂයේදී සිදුකරන ලදී.ධර්මරාජ පිරිවෙනෙහි පවතින නායයෑම් අවදානම් තත්වය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කල ඉල්ලීමකට අනුව මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදි. | ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේදී ප්‍රමුඛ අවශ්‍යතාවය හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් රු.මිලියන11.02 ක මුදලක් පර්යේෂණ සංවිධානය වෙත ලැබී තිබූ අතර 2016 වර්ෂය තුලදී රු.මිලියන 6.00 ක් උපයෝජනය කර තිබුණි. ඉතිරිව පැවති රු.මිලියන 5.02 ක මුදල 2018 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | ප්‍රජා මූලික ආපදා අවම කිරීම වෙනුවෙන් ඉදිරියේ දී මෙම මුදල් වැය කිරීමට බලාපොරොත්තු වේ. | ප්‍රදානයන් ලබාදුන් කාර්යයන් ඉටු කිරීමට පියවර ගතයුතුය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දින 150 කින් අවසන් කළ යුතු බවට සැලසුම් කර තිබුණු කළුතර දිස්ත්‍රික්කයේ අතලේ මහා විද්‍යාලයේ නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ආරම්භකර දින 82 ක් ගත වී තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණක් විය. | අතලේ මහා විද්‍යාලයේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට සියයට 90 ක් පමණ අවසන් කර ඇති අතර ඉදිරි මාස 02 තුල සම්පූර්ණයෙන්ම අවසන් කර අදාල පාර්ශවයන්ට භාර දීමට කටයුතු යොදා ඇත. | නියමිත දිනට ව්‍යාපෘති නිම කිරීම මගින් අතිරේක පිරිවැයක් දැරීමේ හා ආපදා අවදානම අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

පර්යේෂණ සංවිධානයේ නව කාර්යාල හා විද්‍යාගාර ගොඩනැගිල්ල සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පර්යේෂණ සංවිධානය නව කාර්යාල හා විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරිමේ කොන්ත්‍රාත් කාලය අවස්ථා 03 දී දීර්ඝ කර තිබුණ අතර ඒඅනුව 2017 දෙසැම්බර් 21 වන දින වන විට අවසන් කිරිමට නියමිත ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්කර නොතිබුණි. | ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු වූ සියළුම කරුණු කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර ඒවා වේ. | (අ) ගිවිසුම්ගත කාල සීමාව තුල කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවෙත පෙලඹවීම අවශ්‍ය වේ.<br><br>(ආ) කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර කරුනු අවම කර ගැනීමෙන් කොන්ත්‍රාත් පරිපාලන කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පර්යේෂණ සංවිධනය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමෙහි 4.5 ඡේදය ප්‍රකාරව අන්තර් ගෙවීම් බිල්පතක අවම වටිනාකම රු.මිලියන 12.5 ක් බව සඳහන් වුවද ප්‍රවර්තන වර්ෂය තුල අවස්ථා 30 කදී රු. මිලියන 95.74 ක මුදලක් ගෙවා තිබුණු නමුත් ඒවා අවම බිල්පත් වටිනාකමට වඩා අඩු අගයක් ගෙන තිබුණි. සිවිල් වැඩ වෙනුවෙන් ගෙවා තිබුණු මුදලින් රු.මිලියන 38.31ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් බාහිර ආයතන වෙත ගෙවා තිබුණි. | ඉදිකිරීමේ ප්‍රගතිය වැඩි කර ගැනීමට ගොඩනැගිලි ද්‍රව්‍ය හා කම්කරුවන් අවශ්‍ය පරිදි වැඩබිම වෙත සැපයිය යුතු වේ. මේ සඳහා කොන්ත්‍රාත්කරුගේ මුදල් සංසරණය සතුටුදායක මට්ටමින් පැවතිය යුතු වන අතර එම අරමුණ සහිතව ,බිල්පත් අවම වටිනාකමට අඩු වුව ද | කොන්ත්‍රාත්කරුට අතිරේක මූල්‍යමය වාසි ලබා ගැනීමට හැකිවන ආකාරයට කටයුතු කිරීමෙන් වැලකිය යුතු වේ. උප කොන්ත්‍රාත් කරුවන් වෙත සෘජුව මුදල් ගෙවීම අත්තිකාරම් සඳහා ඇපකර නොමැතිව සිදු කරන ගෙවීමක් වේ. එවැනි ගෙවීමක මූල්‍යමය අවදානම |

| | | | |
|---|---|---|---|
| | | ගෙවීමට කටයුතු කර ඇත. තවද කොන්ත්‍රාත්කරුගේ මුදල් දුෂ්කරතා නිසා ප්‍රධාන සැපයුම්කරුවන් වන කොන්ක්‍රීට් කම්බි සහ ගඩොල් වැඩබිම වෙත ගෙන්වා ගැනිමේ අපහසුතා සිදුවිය. එම නිසා කොන්ත්‍රාත්කරු එම ආයතන සමඟ ඇතිකරගත් සාකච්ඡා මත හා අප ආයතනයේද එකඟතාවය ද ඇතුව කොන්ත්‍රාත්කරුගේ බිල්පත්වලින් අඩුකර කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත එම සැපයුම්කරුවන් වෙත ඍජුව ගෙවීමට කටයුතු කරන ලදී. | ඉහල බැවින් එවැනි ගෙවීම් වලින් වැලකිය යුතු වේ. |
| (ඇ) | පර්යේෂණ සංවිධානයේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ විද්‍යාගාරය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරිම ප්‍රමාද වීම හේතුවෙන් සංවිධානයේ අංශ කිහිපයක් පවත්වාගෙන යාම සඳහා කුලියට ලබාගෙන තිබුණ ගොඩනැගිල්ල සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 3.73 ක බදු මුදලක් ගෙවා තිබුණි. තවද ඉදි කිරිම් කටයුතු උපදේශක සේවා සැපයිම වෙනුවෙන් පර්යේෂණ සංවිධානයේ නිලධාරීන්ට රු.මිලියන 8.88 ක් ගෙවා තිබුණි. | ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් මෙම වියදම් දැරීමට සිදුවිය. මේ වන විට ප්‍රධාන සැකැස්මේ ඉදිකිරිම් අවසාන අදියරේ පවතින අතර ගොඩනැගිල්ලේ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු යොදා ඇත. | (අ) අතිරේක වියදම් පාලනය කිරිමට කටයුතු කළ යුතු වේ.<br><br>(ආ) පර්යේෂණ සංවිධානය විසින්ම සිවිල් ඉදිකිරිම් උපදේශක කටයුතු සිදු කිරිම මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වූ පිරිවැය වාසිය ලබා ගැනීම ප්‍රශ්ණකාරිව පවතින බව තහවුරු වේ. |
| (ඇ) | නව කාර්යාල හා විද්‍යාගාර ගොඩනැගිල්ලේ විදුලි හා ජලනල කාර්යයන් සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණ අතර ගිවිසුමට අනුව 2018 මැයි 29 වන විට එම කාර්යයන් නිම කළ යුතු වුවද ගොඩනැගිල්ල ඉදිකිරීම් භාර කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය හේතුවෙන් එම කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුලදී මෙම කාර්යය සඳහා රු.මිලියන 1.89 ක් වූ අන්තර් ගෙවීම් බිල්පතක් පමණක් ඉදිරිපත්කර තිබුණු අතර ලබාදී තිබුණු අත්තිකාරම්වලින් පියවා නොතිබුණු රු.මිලියන 2.69 ක් වූ මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂයකට අධික කාලයක් එම කොන්ත්‍රාත්කරු අත රැඳී තිබුණි. | ඉහත කාරණා මත ගොඩනැගිල්ලේ ප්‍රධාන ව්‍යුහය ඉදිකිරීම ප්‍රමාද වීම නිසා විදුලිමය හා ජලනල කාර්යයන් සිදු කිරීම ද ප්‍රමාද වී ඇත. ජලනල කාර්යයන් සිදු කරන කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් වෙනස් නොකරන අතර මිල ගණන් විචලනය පමණක් සලකා බැලීම සිදු කෙරේ. තවද අත්තිකාරම් මුදල් පියවා ගැනීම ගිවිසුමට අනුව සිදු කරනු ලබයි.මේ අනුව අවසන් කරන ලද වැඩවලට අදාල බිල්පත් වලින් මුදල් පියවා ගැනීම සිදු කෙරේ. | ගිවිසුම් ප්‍රකාර නියමිත දිනට කාර්යය ඉටු කර ගැනීම මගින් පිරිවැය පාලනය කාර්යක්ෂමව සිදු කිරිම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| (ඉ) නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂය අවසාන වන විට රු.මිලියන 450 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරගෙන තිබුණු නමුත් ඉන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 206.25 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව නිදහස් කරගත් ප්‍රතිපාදන වලින් රු. මිලියන 243.75 ක මුදලක් නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය නොකර පර්යේෂණ සංවිධානයේ බැංකු ගිණුම් වල රඳවාගෙන තිබුණු බවට නිරීක්ෂණය විය. | මෙම ගොඩනැගිල්ලේ මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 600 ක් පමණ වන අතර මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 450ක මුදලක් ලැබුණු අතර ඉතිරි මුදල සංවිධානය විසින් දරාගනු ලැබේ. තවද මේ වනවිට රු. මිලියන 587ක පමණ කොන්ත්‍රාත් පිරිනමා ඇති අතර ඔවුන්ගේ භෞතික ප්‍රගතිය අනුව බිල්පත් පියවීම සඳහා මෙම මුදල් භාවිතා කරනු ලැබේ. | කොන්ත්‍රාත් පරිපාලනය විචක්ෂනව සිදු කිරීම මගින් ප්‍රතිපාදනය කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වයංක්‍රිය වර්ෂාමාන 50 ක් ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ දී කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ ආයතනය ගිවිසගත් කාලය තුල කාර්යය සම්පූර්ණ කර නොතිබුණ නමුත් ඒ බව නොසලකා නැවත 2018 වර්ෂයේ දී ස්වයංක්‍රිය වර්ෂාමාන 30 ක් ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. | 2018 වර්ෂයට අදාල ලංසු ඇගයීම් සිදු කරන අවස්ථාව වන විට අදාල ආයතනය 2017 වර්ෂයට අදාල ස්වයංක්‍රිය වර්ෂාමාන නිසි පරිදි ස්ථාපනය කිරීමට කටයුතු කර තිබුණි. | නියමිත දිනට අදාල කාර්යය නිම කිරීමට අවශ්‍ය පියවර ගැනීම මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |